සියලු ම හිමිකම් ඇවිරිණි/All Right Reserved / முழுப் பதிப்புரிமையுடையது

# ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය
# இலங்கை அபிவிருத்தி நிருவாக நிறுவகம்
# SRI LANKA INSTITUTE OF DEVELOPMENT ADMINISTRATION

**ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය 2019(I)**

| | | |
|---|---|---|
| කාලය : පැය 03 | අපරාධ නීතිය හා සාක්ෂි නීතිය (01-III) | විභාග අංකය<br>Index No / சுட்டெண்<br>.................................... |

- ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

---

01. රජයේ සේවකයින් විසින් සිදු කරනු ලබන පහත වැරදි දණ්ඩ නීති සංග්‍රහය ඇසුරින් පැහැදිලි කරන්න.

    i. තුටු පඬුරු ගැනීම (Gratification). (ලකුණු 10)

    ii. කූට ලේඛන (Fraud Documents) සැකසීම. (ලකුණු 10)

02. පහත දැක්වෙන අවස්ථාවන්හිදී, දණ්ඩ නීති සංග්‍රහය අනුව සාපරාධී වරදක් සම්බන්ධයෙන් අදාළ වන සාමාන්‍ය ව්‍යතිරේක විස්තර කරන්න.

    i. අධිකරණය විසින් යසස් අර්සකුලරත්න සිරභාරයට ගැනීමට නියම කර තිබියදී, අධිකරණ නිලධාරියෙකු වන ඉඳුනිල් විසින් නිසි විභාගයකින් පසු යසස් අර්සකුලරත්න යයි විශ්වාස කරමින් ගාමිණී අර්සකුලරත්න සිරභාරයට ගනියි. ඉඳුනිල් කිසිදු වරදක් කර නැත. (ලකුණු 05)

    ii. මිනීමැරුමක් ලෙස අමල්ට හැඟෙන දෙයක් සෆ්රාන් විසින් සිදු කරන බව අමල් දකියි. මිනීමරුවන් මිනීමැරීමේදී ඔවුන් අල්ලාගැනීමට සියලු තැනැත්තන් හට නීතියෙන් දී තිබෙන බලය අමල් තමාගේ හොඳම විනිශ්චය අනුව සද්භාවයෙන් පාවිච්චි කිරීමෙන් නිසි බලධරයන් ඉදිරියට ගෙන ඒම සඳහා සෆ්රාන් අල්ලා ගනියි. සෆ්රාන් ආත්මාරක්ෂාව පිණිස ක්‍රියා කරන ලද බැව් දැන ගන්නට ලැබුණත් අමල් විසින් වරදක් කර නැත. (ලකුණු 05)

    iii ශාමන් අත් පොරවකින් වැඩ කරයි. පොරවෙහි තලය විසිවී ගොස් අසල සිටි මිනිසෙකුට වැදීමෙන් ඔහු මියයයි. ශාමන්ගේ නිසි ප්‍රවේසමෙහි අඩුවක් නොතිබිණි නම්, ඔහුගේ ක්‍රියාවට සමාව දිය හැකිය; ඔහු සිදු කළේ වරදක් ද නොවේ. (ලකුණු 05)

    iv. විශාල ගින්නකදී ගින්න පැතිරී යාම වළක්වනු පිණිස දල්පදාදු ගින්න අසල නිවෙස් කිහිපයක් කඩා දමයි. මනුෂ්‍ය ජීවිත හා දේපළ බේරා ගැනීමේ අදහස ඇතිව ඔහු මෙය සද්භාවයෙන් සිදු කරයි. වැළැක්විය යුතු පීඩාවද, එය වහාම කළ යුතු බවද, දල්පදාදුගේ ක්‍රියාවට සමාව දිය යුතු තරමේ ස්වභාවය බව වැටහී ගියහොත් දල්පදාදු වරදකට වරදකරු නොවේ. (ලකුණු 05)

03. දණ්ඩ නීති සංග්‍රහයට අනුව,

i. නීතිවිරෝධී රැස්වීමක් යනු කුමක්ද? (ලකුණු 05)

ii. නීතිවිරෝධී රැස්වීමක සාමාජිකයෙකු ලෙස සලකනු ලබන්නේ කවරකුද? (ලකුණු 05)

iii. නීතිවිරෝධී රැස්වීමක සාමාජිකයෙකුට ලැබෙන දඬුවම කවරාකාරද? (ලකුණු 05)

iv. යම් මාරක ආයුධයක් සහිතව නීතිවිරෝධී රැස්වීමකට සහභාගී වූවෙකුට අදාළ වන විධිවිධාන මොනවාද? (ලකුණු 05)

04. i. කථිත සාක්ෂි යන්න පැහැදිලි කරන්න. (ලකුණු 05)

ii. "සියලුම අවස්ථාවන්හිදී කථිත සාක්ෂි ප්‍රත්‍යක්ෂව තිබිය යුතුයි." විමසන්න. (ලකුණු 15)

05. පහත දැක්වෙන කරුණු අතුරින් හතරක් (04) පිළිබඳ සාක්ෂි ආඥා පනතට අනුව කෙටි සටහන් ලියන්න.

i. කරුණ

ii. ලේඛනය

iii. සාක්ෂි

iv. ඒත්තු ගැන්වීම

v. වරද කියාපෑම (ලකුණු 05×4 = 20)

06. මහජනයාට යම් අඩුපාඩුවක්, අන්තරායක් හෝ අප්‍රසන්නතාවයක් ඇති වීම මත මහජන කරදරයක් ඇති විය හැකිය. එලෙස මහජන කරදර ඇතිවිය හැකි අවස්ථා පහක් (05) සවිස්තරාත්මකව පැහැදිලි කරන්න. (ලකුණු 20)

07. බත්තරමුල්ල පයිප්ප පාරේ පළමුවන පටුමග හා තුන්වෙනි පටුමග එකිනෙකට සම්බන්ධ වන නගරසභා පාරවල් වන අතර, පටුමගවාසීන් සියල්ලන්ම යාම් ඒම් පිණිස පොදුවේ මෙම නගරසභා පාරවල් දෙකම භාවිතා කරයි. නමුත් පසුගිය සිකුරාදා දින තුන්වන පටුමගේ පදිංචි ගිල්බට් විසින් පළමුවන පටුමගේ පදිංචිවාසීන්ට තුන්වන පටුමගෙන් යෑම අවහිර කරන ලදී. මාර්ග භාවිතය අවහිර කිරීමේ නීත්‍යානුකූල පසුබිම විස්තර කරන්න. (ලකුණු 20)

***********